**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ - 1 කොටස පිළිබඳ ව්‍යාපෘතිය - 2022**

-----------------------------------------------------------------------------------------------------------

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ - 1 කොටස පිළිබඳ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2015 සැප්තැම්බර් 17 දින එළඹි අංක 3267- එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ 4.06 (අ) වගන්තිය සහ 2015 සැප්තැම්බර් 17 දින එළඹි අංක 3268 - එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුමේ 4.03 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව වාරිමාර්ග අමාත්‍යාංශය විධායක නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ පරමාර්ථය වන්නේ වැඩසටහන් ප්‍රදේශයේ කෘෂිකාර්මික, පානීය හා වාණිජ කටයුතු සඳහා ජල සම්පත් සඳහා ආරක්ෂිත ප්‍රවේශයයි. උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතිය, වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය, මිනිපේ වම් ඉවුර ඇළ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යන අංග තුනක් යටතේ වැඩසටහනේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 190 ට සමාන රු. මිලියන 26,720.80 ක් වන අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 150 ට සමාන රු. මිලියන 21,095.37 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි මුදල රු. මිලියන 5,625.43 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කෙරේ. වැඩසටහන 2015 ජූනි 24 දින එහි කටයුතු ආරම්භ කර 2019 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, වැඩසටහනේ කටයුතු අවසන් කිරීමේ දිනය 2024 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා

ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| | සංරචක | 2022 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධන ප්‍රතිශතය | 2022 දෙසැම්බර් 31 දිනට ලගාකරගත් කාර්යසාධනය ප්‍රතිශතය | විගණන නිරීක්ෂණ | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| i. | ඉහළ ඇලහැර ඇළ ඉදිකිරීම (කි.මී. 0+100 සිට 6+226 කි.මී.) | 100 | 64 | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත්තු සැලසුම් කළ කාලය තුළ ලබා දී නොතිබුණි. ව්‍යාපෘති කාලය 2022 ජුනි 30 දක්වා වසර 05කින් දීර්ඝ කර පසුව 2024 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබූ අතර මුල් සැලැස්මට අනුව කොන්ත්‍රාත්තු සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි. | අමතර වැඩ සහ ප්‍රමාණ වෙනස් කිරීම්, ඉදිකිරීම් නිසි ලෙස සැලසුම් නොකිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රමාද වීම වැනි හේතු නිසා ව්‍යාපෘති කටයුතු නියමිත කාල සීමාවේදී නිම කර ගැනීමට නොහැකි විය. |
| ii. | නාබඩගහවත්ත වැවේ සිට මහකිතුල ජලාශයේ පිවිසුම දක්වා ප්‍රධාන ඇළ ඉදිකිරීම (කි.මී. 5+250 to කි.මී. 22+ 460) | 100 | 77 | | |
| iii. | මහකිතුල උමග, මහකිතුල සහ මහකිරුළ ජලාශ, පෝෂක ඇළ මහකිතුල සිට මහකිරුළ ජලාශය දක්වා කිලෝමීටර් 3.3ක් දිගින් යුතුව ඉදිකිරීම.<br>LB සහ RD ඇල සඳහා ජල පාලන සහ මිනුම් | 100 | 03 | | |
| iv. | පහසුකම් ඇතුළුව මිනිපේ අමුණේ රුදවුම ඉහළ නැංවීම | 100 | 82 | | |

**කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය**

i. වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම මත පදනම්ව මෙම කොන්ත්‍රාත් පැකේජවල පූර්ව සැලසුම් කලින් කලට වෙනස් කිරීමට සිදු විය.

ii. 2019 දී, පාස්කු ප්‍රහාරය හේතුවෙන් පුපුරණ ද්‍රව්‍ය ලබා ගැනීම දුෂ්කර කාර්යයක් බවට පත් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිකිරීම් කටයුතු සඳහා පිපිරුම් ද්‍රව්‍ය වැනි ද්‍රව්‍ය හිඟයක් ඇති වූ අතර මේවා ප්‍රවාහනයට බාධා කිරීම් හේතුවෙන් ශ්‍රම හා සංචලනය ගැටළු ඇති විය. 2020 සහ 2021 Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රම සංචලනය, ද්‍රව්‍ය සැපයුම ආදිය ඉදිකිරීම් ක්‍රියාවලිය සැලකිය යුතු ලෙස මන්දගාමී විය. 2022 වසරේ මුල්‍ය අර්බුද හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල වැඩිවීම සහ ඉන්ධන හිඟය සහ ආනයනය සීමා කිරීම නිසා මෙම තත්ත්වය උග්‍ර විය. මෙම ඉදිකිරීම් කටයුතු වාරි

ක්ෂේත්‍රවලට විධිමත් ජල සැපයුමක් පවත්වාගෙන යන අතර සිදු කිරීමට සිදු වූ බැවින් ඉදිකිරීම් කටයුතු සඳහා වරින් වර බාධා එල්ල විය.

iii. 1986 වසරේ සිට වන්දි නොගෙවා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට තිබූ ඇතැම් ඉඩම් තිබූ බව ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයට අවබෝධ විය. මේ නිසා වයඹ පළාතේ ඉදිකිරීම් කාලය තුළ මුළු කොටස සඳහාම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට සිදු විය. ගිවිසුම අවසානය දක්වාම මෙම තත්වය දැඩි ලෙස බලපෑ අතර ඉහත බාධාවන් සමඟ පවා මේ වන විට කොන්ත්‍රාත් පැකේජ හයක් අවසන් කර ඇත පැකේජ හතරක් තවමත් ක්‍රියාත්මක වෙමින් පවතී කොන්ත්‍රාත්තු 4 න් 3 ක් 2023 අවසන් වන විට අවසන් කිරීමට නියමිතය.

**විගණකගේ නිර්දේශය**

(i) සිදු කරන ලද වියදම්වලට අදාල ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

(ii) හැකි ඉක්මනින් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කොන්ත්‍රාතත්කරුවන්ට සහ උපදේශන සමාගමට ලිඛිතව දැනගැනීමට සැලැස්විය යුතුය.

(iii) වැඩසටහන සිය ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව එහි ක්‍රියාකාරකම් සිදු කළ යුතුය.

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | උතුරු මැද පළාත් මහා ඇළ ව්‍යාපෘතිය යටතේ මොරගහකන්ද ජලාශයේ සිට කිලෝමීටර් 6.225 ක ඇළ මාර්ගයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 3,254.29 කට ඉටු කිරීමට 2016 සිට 2020 දක්වා කාලය තුළ දේශීය කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී තිබුණි. 2021 මැයි 31 වන විටත් ඉදිකිරීම්වල ප්‍රගතිය සියයට 64ක් පමණක් වූ අතර කොන්ත්‍රාත්කරුගේ මූල්‍යමය බාධාවන් හේතුවෙන් වැඩ නිම කිරීමට නොහැකි විය. කොන්ත්‍රාත්තුව දිගටම කරගෙන යාමට නොහැකි වීම හේතුවෙන් 2021 ජූලි 13 දින අවලංගු කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු විසින් බැංකුවේ තබා ඇති අත්තිකාරම් සහ කාර්ය සාධන ඇපකරවලින් අලාභ අයකර ගැනීම වළක්වාලමින් නඩුවක් පවරා තිබූ බැවින් කොන්ත්‍රාත්කරුගෙන් අය කළ යුතු රු. මිලියන 185.89ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | කොන්ත්‍රාත්කරු අලාභ අයකර ගැනීම වළක්වාලමින් නඩුවක් පවරා ඇතත්, වාරිමාර්ග අමාත්‍යාංශයද නීතිපති දෙපාර්තමේන්තුව හරහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත්තේ බේරුම්කරුගේ පාර්ශ්ව බේරුම්කරණ ක්‍රියාවලිය බේරුම්කරු විසින් අවසන් කරන ලද බැවිනි. නීත්‍යානුකූල ක්‍රියාවලිය හරහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් තවමත් අයකරගත යුතු වුවද. කොන්ත්‍රාත්කරු දැන් ඈවර කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත පාර්ශවකරුවෙකු වීමට අප විසින් දැනටමත් ඉල්ලුම් කර ඇත. | බැංකු ඇපකර මුදල් බවට පත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018-2020 කාලය තුළ මිනිපේ වම් ඉවුර සහ දකුණු ඉවුර ඇළ සඳහා ජල පාලන හා මිනුම් පහසුකම් ඇතුළු මිනිපේ අමුණේ උස ඉහළ | කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් සංශෝධන ගිවිසුම 2023 සැප්තැම්බර් වන විට අවසන් | මිල ඉහළ යාමේ පාඩුව අවම කර ගැනීමටත් නියමිත කාලය තුළ |

| | | | |
|---|---|---|---|
| | නැංවීමේ කොන්ත්‍රාත්තුව විදේශ කොන්ත්‍රාත්කරුවෙකුට රු. මිලියන 1,864.80 කට ප්‍රධානය කර තිබුණි. කොන්ත්‍රාත්තුව 2021 ජූලි 13 දක්වාත්, පසුව 2023 සැප්තැම්බර් දක්වාත් දීර්ඝ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉදිකිරීම් ප්‍රගතිය තිබුණේ සියයට 82.5ක් පමණක් විය. කොන්ත්‍රාත්තුව අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ මිල විචලනය රුපියල් මිලියන 112.09 කි. තවද, අමතර වැඩ සහ ප්‍රමාණය වෙනස්කම් සඳහා කොන්ත්‍රාත්කරුට වෙන් කර තිබූ ප්‍රතිපාදනවලට වඩා රුපියල් මිලියන 91.27 ක් වැඩිපුර ගෙවා තිබුණි. | කිරීමේ ඉලක්කගත දිනය සාක්ෂාත් කර ගැනීම සඳහා සන්ධිස්ථාන දැනටමත් අත්සන් කර ඇත. වර්තමාන ඉදිකිරීම් ප්‍රගතිය 86% ක් වන අතර කොන්ත්‍රාත්කරු විසින් නිම කිරීමේ ඉලක්කගත දිනයන් සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩි සම්පත් රැස් කර ගෙන තිබේ. | කාර්යය නිම කිරීමටත් පිළියම් යෙදිය යුතුය. |
| (ඇ) (i) | වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය යටතේ නබඩගහවත්තේ සිට මහකිතුල ජලාශයේ බිම් උමග දක්වා ප්‍රධාන ඇළ කිලෝමීටර 5.25 සිට 22.30 දක්වා ඉදිකිරීම 2018-2021 වසර තුළදී නිම කිරීමට විදේශීය කොන්ත්‍රාත්කරුවෙකුට රු. මිලියන 6,284 කට ලබා දී තිබුණි. කෙසේ වෙතත්, පසුව එය 2023 දෙසැම්බර් 05 දක්වා දීර්ඝ කරන ලද අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 77ක් පමණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව සඳහා වෙන් කළ මුදලට වඩා මිලියන රු.1,700.84 ක් වැඩි වී තිබුණි. | NWPCP-ICB-2- ප්‍රධාන ඇළ සඳහා නබඩගහවත්තේ සිට මහකිතුල ජලාශයේ බිම් උමං මාර්ගය සඳහා කොන්ත්‍රාත්තු මිල වැඩි කරන ලද්දේ සීමා කරන ලද මාර්ග අයිතිය සමඟ විශේෂයෙන් ඇල සැලසුම් පෙළගැස්මේ විෂය පථය වෙනස් වීම හේතුවෙනි. | ක්‍රියාකාරකම් සැලසුම් කළ යුත්තේ බලපාන සියලුම සාධක සලකා බලා එහි ඉලක්ක සපුරා ගැනීම සඳහා වන සැලසුම් අනුව ක්‍රියාත්මක සලකා බැලීමෙනි. |
| (ii) | ඇල ඉදිකිරීම් කොන්ත්රාත්තුවේ මුල් සැලැස්මේ දුර්වලතා නිවැරදි කිරීම සඳහා, සැලසුම් කළ මුදලට වඩා රු. මිලියන 97.52 ක් වැඩිපුර වියදම් කර තිබූ අතර, එම මුදල ඉදිරියේදී රු. මිලියන 600 න් පමණ වැඩි වනු ඇතැයි ඇස්තමේන්තු කර තිබුණි. | NWPCP-ICB-2 හි මුල් වැඩ ප්‍රමාණක පත්‍රයේ ප්‍රමාණයේ වැඩිවීම - 9.01%, වැඩවල විචලනය - 16.24%, මිල වැඩිකිරීම් සම්බන්ධ ඉඩම් භාරදීමේ ප්‍රමාදයන්/EOT'S - 8.28% සහ නිත්‍ය මිල වැඩිවීම් - 65.9% හේතුවෙන් වැඩි විය.<br>ඒ අනුව 65.9% ක උපරිම ප්‍රතිශතයකින් 2022 මාර්තු සිට මිල ඉහළ යාමේ සිදුවීමට නියමිතය. | ක්‍රියාකාරකම් සැලසුම් කළ යුත්තේ බලපාන සියලුම සාධක සලකා බලා එහි ඉලක්ක සපුරා ගැනීම සඳහා වන සැලසුම් අනුව ක්‍රියාත්මක කිරීමෙනි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වැඩසටහනේ පළමු කොටස සඳහා 2015 නොවැම්බර් 16 සිට මාස 60 ක කාලයක් සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 22.09 ක් වටිනා උපදේශන සේවා ගිවිසුමක් අත්සන් කර තිබූ අතර එය කාල සැලැස්මේ දිගුව අනුව මාස 97 කින් 2023 දෙසැම්බර් දක්වා දීර්ඝ කර තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව විසින් වාරික 1 සහ 2 සඳහා උපදේශන සේවා ගාස්තුව ඇමෙරිකානු ඩොලර් මිලියන 25.93ක් වෙන් කර තිබුණද අවස්ථා 06කදී සිදු කරන ලද සංශෝධනවලට අනුව උපදේශන සේවා ගාස්තුව ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 47.82ක් දක්වා වැඩි කර තිබුණි. | කොන්ත්‍රාත්තුව සඳහා ලබා දී ඇති කාලය දීර්ඝ කිරීම හේතුවෙන් උපදේශන පිරිවැය වැඩි වී ඇත. දැනට පවතින පැකේජ සමඟ ඉදිකිරීම් කටයුතු අඩු කිරීම සලකා බලමින් දේශීය හා විදේශීය විශේෂඥයින්ගේ යෙදවුම් අඩු කිරීමට කටයුතු කර ඇත. අවසන් කිරීම තීරණය කිරීමෙන් පසුව NWPCP-ICB-1 පැකේජය සඳහා මාස 3ක් ඇතුළත RE කාර්යාලය වසා දමා වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ඇත. ජාත්‍යන්තර යෙදවුම් වෙන් කිරීම සඳහා දැනටමත් සීමාවන් පවා ක්‍රියාත්මක කර ඇත. පූර්ණ කාලීන පැවරුම් වෙනුවට යෙදවුම් පමණක් සමඟ ජාතික කාර්ය මණ්ඩලය නව ආදේශ කිරීම නිර්දේශ කරන ලදී. | අමතර වියදම් අවම කර නියමිත කාලය තුළ ඉදිකිරීම් අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඉ) | කොළඹ ව්‍යාපෘති කාර්යාලයේ සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කරන වැඩබිම් 08ක පිහිටුවා ඇති උපදේශකයින්ට අයත් කාර්යාලවල සේවය කරන කාර්ය මණ්ඩලවල වැටුප් ඇතුළුව මාසික උපදේශන ගාස්තු වශයෙන් රු. මිලියන 85ක් උපදේශන සමාගමට ගෙවා ඇත. ව්‍යාපෘති කාලසීමාව මත උපදේශන ගාස්තු ගෙවීම හේතුවෙන් මෙම පිරිවැය වැඩි වී තිබුණි. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ කාලසීමාව දීර්ඝ කර ඇති අතර කොන්ත්‍රාත්තු සෙමෙන් සිදුවෙමින් පවතී. | කෙසේ වෙතත්, වර්තමාන අගය නිවැරදි වේ. සාමාන්‍ය සඳහා ගැලපුම් කල යුතුය. | මූල්‍ය පාලනය ශක්තිමත් කළ යුතුයි. |

**2.3 පද්ධති සහ පාලන**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2016 සිට 2022 දක්වා කාලය සඳහා වෙන් කරන ලද අරමුදල් ඌන උපයෝජනය කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය රු. මිලියන 106.55 ක බැදීම් ගාස්තුව ක් 2022 වසර අවසන් වන විට වැය කර තිබුණි. | ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා EOT ලබා දීමට සිදු විය. අනපේක්ෂිත සහ පාලනය කළ නොහැකි සිදුවීම් හේතුවෙන් සැලසුම් කර තිබූ පරිදි අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. එබැවින් ආසියානු සංවර්ධන බැංකුවෙන් වෙන් කරන ලද අරමුදල් ඌන ලෙස භාවිතා කරන ලදී | මූල්‍ය පාලනය ශක්තිමත් කළ යුතුයි. |